බෞද්ධාලෝකය

ඊ පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ 2567
පොසොන් මස 03 වන සෙනසුරාදා

බෞද්ධාලෝකය

වැනසී යන අපේ සංස්කෘතික උරුමය සුරකිමු

වසර දෙදහස් පන්සියයක බෞද්ධ ඉතිහාසයේ උරුමය සතු අපි, ඒ ප්‍රවේණිගත උරුමයේ හිමිකාරයන් වෙමු. එය සුරක්ෂිත කර, පෝෂ ණය කර, අනාගත පරපුරට උරුම කර දීමේ හා අප හට සුවිශේෂී වගකීම හා කාර්ය භාරය පැවරී ඇත්තේය. යුගයේ උත්කෘෂ්ට මෙහෙවර ඉටු කිරීමේ පරමාධ්‍යාශයෙන් අප ගන්නා දෘඪ ප්‍රසංශනීය පණිවිඩය ඔබ වෙත රැගෙන එන බෞද්ධාලෝකය පුවත්පත, ඔබට හඳුන්වා දීමට කැමැත්තෙමු.

අද්‍යතන සමාජයේ අප සතු සංස්කෘතික උරුම් දායාද විභූෂණයකට වඩා. විලෝපනයකට තුඩු දෙන අන්දමේ අභියෝගවලට මුහුණ දී ඇත. ඒ අභියෝගය ජය ගැනීමේ හොඳ ම මාර්ගය නම්, නොවරදින උපාය නම් අප සතු ඒ සංස්කෘතික උරුමය දායාද පිළිබඳ වත්මන් පුරපුර තුළ අනුභූතියක් හා අනුරතියක් ඇති කරවීමයි. තත් භාරධුර කාර්යයෙහි තප්පර වී සිටින මේ සංග්‍රයේ. වැනසී යන අපගේ බෞද්ධ සංස්කෘතික උරුමය අනාදිමත් කාලයක සිට අපට උරුමව තිබෙන බෞද්ධ උරුමය. අපට ආවේණික වූ අප සතු අනන්‍යතා විදහා පාන්නා වූ සංස්කෘතිකාංග, ආචාර, විහාර ගතිගුණ, සිරිත් විරිත්, සාහිත්‍ය කලා, විද්‍යා තත් සංස්කෘතික ප්‍රබෝධයක් ජනතාවට උදාකර දීම මෙහි අපේක්ෂාවයි.

අධිරාජ්‍යවාදී ග්‍රහණයට හසු වීමෙන්, යටත් විජිතව පැවතුනු ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතික උරුමය විනාශව, නෂ්ටාවශේෂ විය. පූජ්‍ය වැලිවිටියේ සරණංකර හිමි, පූජ්‍ය මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි, අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා වැනි ගිහි පැවිදි සුදීමතුන්ගේ පරම අභිලාෂයෙන් යම් පුනරුදයක් ලබමින්, ඩබ්. ජයතිලක මැතිතුමන් බොදු මග සමුළුව ආරම්භ කිරීම දක්වා පුනරුදයක් විය. එතැන්සිට වසර සියයක් ගතව ඇති බොදු මහා සමුළුව, එම අභිලාෂ් කාලානුරූපව නම් වගකීමම් කොට ගනිමින්, අප සතු සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කර පවත්වා ගැනීමටත්, හුදෙක් බෞද්ධයා නියම බෞද්ධයකු ලෙස හැඩ ගැසී, ගිහි පැවිදි දෙපක්ෂය අතර මනා සුහදතාව වර්ධනය කර ගනිමින්,

සම්බුද්ධ ශාසනයත්, බෞද්ධ උරුමයත් රැක ගැනීමට සංවිධානය කොට ක්‍රියාවට නැංවීමට, පාවුන තන්ත්‍රය ද එක්කොට්, තත් ජන විඥානයෙහි අපගේ බෞද්ධ උරුමය පිළිබඳ දැනුම පුළුල් කිරීමේ පරමාර්ථයෙන්, මෙවක පටන් මේ බෞද්ධාලෝක සංග්‍රහය තුළින් බලාපොරොත්තු වෙමු.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් මාසිකව සෑම පුර පසළොස්වක පොහෝ දිනකම පලකරනු ලබන බෞද්ධාලෝකය ඊ-පුවත්පත සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.

නිර්මාණ ඉදිරිපත් කිරීමට කැමැත්තේ නම්, එම නිර්මාණ පහත සඳහන් ලිපිනයට ලියා එවීම හෝ විද්‍යුත් ලිපිනය ඔස්සේ එවීමට කටයුතු කළ හැක (පිටු දෙකක ප්‍රමාණයට සෑහෙන තරම්)

සෑම කලාපයක්ම www.acbc.lk අප වෙබ් අඩවියෙන් නිකුත් කරන අතර මීට පෙර නිකුත් කරන ලද මාසික ඊ-පුවත්පත් අප වෙබ් අඩවියෙන් පරිශීලනය කළ හැක

බෞද්ධාලෝකය

උපදේශක මණ්ඩලය
මහාචාර්ය නිමල් ද සිල්වා
මහාචාර්ය මාලිනී ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

සංස්කරන කළමණාකරනය
ඉෂාන් බුද්ධික එදිරිසූරිය

සංස්කාරක මණ්ඩලය
නාලක ජයසේන
ශ්‍යාම් නුවන් ගනේවත්ත

පිටු සැකැස්ම
කාවින්ද දිල්ෂාන්
ක්‍රිෂාන්ති දිසානායක

ප්‍රකාශනය
බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
අංක 380. බෞද්ධාලෝක මාවත. කොළඹ 7.
දුරකථනය (011 2691659 / 011 2665047)
ෆැක්ස් (011 2665047)
web : www.acbc.lk
E-mail : buddhistinfo380@gmail.com

මොළයේ සහ භාවනාවේ අන්තර් ක්‍රියාකාරිත්වය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

ප්‍රවේශය

මිනිසා අන්‍ය සත්වයින්ගෙන් වෙන් කර හඳුනාගැනීමේ ප්‍රධානතම ක්‍රියාකාරිත්වන වශයෙන් මිනිස් මොළය හඳුනා ගත හැකිය. මිනිස් මොළයෙහි ක්‍රියාකාරිත්වය මත මිනිසාගේ සහ අන්‍ය සත්වයින්ගේ ද ප්‍රගමනය සීඝයෙන් ළඟා කර ගෙන ඇත. මිනිසා පිළිබඳ ජීව විද්‍යාත්මකව සාකච්ඡා කිරීමේ දී හඳුනා ගත යුතු ප්‍රමුඛතම ඉන්ද්‍රිය මොළයයි. මොළයේ ක්‍රියාකාරිත්වය සංවර්ධනය සඳහා භාවනාව කෙසේ බලපාන්නේ ද යන්න පිළිබඳව විමසීම මෙහි අරමුණයි.

මොළය යනු කුමක් ද?

සෑම සත්වයෙකුටම මොළයක් ඇත.සත්ව සහ වස්තු යන අංගද්වය වෙන්කර හඳුනාගැනීමේ ප්‍රමුඛාංගය වන්නේ මස්තිෂ්කය හෙවත් මොළයයි. බුදු දහමට අනුව භවයන්හි ප්‍රතිසංධිය ලබන්නාවූ භෞතික ශරීරයක් සහිත මනුෂ්‍ය තිරිසන් ආදී සත්ව වර්ගයා මස්තකයෙහි පවත්නා වූ මොළය (මත්තකෙමත්තලුංගන්ති) නම් වූ ඉන්ද්‍රියෙන් යුක්ත වේ. කායික ස්නායුක ක්‍රියාකාරිත්වයන් හඳුනාගැනීම මොළයෙන් සිදු කෙරේ. මොළය මැරුණු කළ භෞතික සත්වයෙකුට ජීවත් විය නොහැකිය යන විද්‍යාත්මක මතය ද එක් පසෙකින් සත්‍ය වන්නේ එබැවිනි.

කශේරුකාව මධ්‍යයෙහි සිස දක්වා ඇදී යන සුසුම්නාව සම්බන්ධ වන්නේ සුසුම්නා ශීර්ෂකයට යි. එම මොළයට සම්බන්ධ වේ.

මොළයෙහි ක්‍රියාකාරිත්වය

සුසුම්නාව මගින් සිදු කරනුයේ ශරීරය පුරා විසිරී පවතින ස්නායු මගින් ලබා දෙන සියලු සංවේදයන් මොළය වෙත සම්ප්‍රේෂණය කිරීමකි. එහිදී දිග පළල උස මහත ආදී වශයෙන් ප්‍රමාණාත්මක තත්ත්වයන් හඳුනා ගනී. වර්ණ හඳුනා ගනී. ශබ්දයන් හඳුනා ගනී. ගඳ සුවඳ හඳුනයි. තිත්ත, කටුක, මිහිරි, ලවන, අම්ල ආදී වශයෙන් රසයන් හඳුනයි. නොයෙක් ආකාරයේ ස්පර්ශයන් හඳුනයි.

මෙම දැනීම් ක්‍රියාවලිය සඳහා උපකාර වන්වෙන් නියුරෝන නම් ශෛල වර්ගයකි. එබඳු ශෛල ප්‍රකෝටි 15 කින් පමණ මොළය සැකසී පවතින බව විද්‍යාව ප්‍රකට කරයි. උත්පත්තියේ දී මිනිස් මොළයෙහි නියුරෝන සෛල ඇත්තේ බිලියන 23ක් පමණ යැයි වෛද්‍ය විද්‍යාව දක්වයි. ක්‍රමානුකූලව සෛල වර්ධනය වෙමින් ප්‍රකෝටි 15 ක් පමණ ප්‍රමාණයක් දක්වා පැමිණෙයි. සෛල වර්ධනය වීම පමණක් පුද්ගල ක්‍රියාකාරිත්වයට ප්‍රමාණාත්මක නොවේ. සෛල අතර සබඳතා ඇතිවීමට බුද්ධි වර්ධනය වශයෙන් දක්වා තිබේ.

මොළය පිළිබඳ බෞද්ධ ආකල්පය

පෙළ බසෙහි මොළය නම්කොට තිබෙනුයේ මත්තලුංග නමිනි. පුද්ගල ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් වන ඉන්ද්‍රියයක් වශයෙන් බුද්ධ භාෂිතය තුළ මොළය හඳුන්වා ඇත.
මත්තලුංග යන පදය පෙළෙහි යෙදී තිබෙනුයේ ද්වත්තිංසාකාරය තුළ පමණි. ශරීරයෙහි පවත්නා අපවිත්‍ර අංගයන් දක්වමින් පිළිකුල වැඩීම සඳහා ද්වත්තිංසාකාරය භාවිතා කෙරේ. එහි තිස් දෙවැනි කුණපස වශයෙන් දක්වා තිබෙනුයේ මුදුනෙහි පවත්නා මොළයයි.

(මත්තකෙ මත්තලුංග).

මොළය පුද්ගල ශරීරයෙහි පවත්නා පුද්ගල ක්‍රියාකාරිත්වය සඳහා බෙහෙවින්ම උපකාරී වන විස්තර වශයෙන් විද්‍යාවෙහි දක්වා තිබේ. එය සැබෑවක් බව සියල්ලෝ ම පිළිගනිති.

බුද්ධ දේශනාව මිනිසුන් පමණක් අරමුණුකොට ගත්තක් නොවේ. මනුස්සා යන්න හැර සත්තා, සබ්බේ සත්තා, දෙවා, බ්‍රහ්මා, යක්ඛා, පෙත, තිරච්ඡාන, ආදී වශයෙන් නියෝජනය කෙරෙන විවිධ සත්ව කොට්ඨාසයන් බුද්ධ භාෂිතය ශ්‍රවනය කරන්නන් හෝ බුද්ධ දේශිතයෙහි පවත්නා කාරුණිකත්වය හා මෛත්‍රිය මුල්කොට ගත් ප්‍රතිපදාව තුළින් සැප ලබන්නෝය. මීට අමතරව සියලු සත්වයෝ නිදුක් වෙත්වා (සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා) යන ප්‍රාර්ථනාව තුළින් ඇසට පෙනෙන, නොපෙනෙන, දුර වසන, සමීපයේ සිටින, ලොකු, කුඩා සෑම ජීවියෙක් විෂයෙහි ම පතුරවනු ලබන ඉතා පුළුල් මෛත්‍රී පරමාදර්ශයක්ද බුදුදහමෙහි ඇත. මේ සියලු සතුන් අතරින් මස්තිෂ්කයක් හෙවත් මොලයක් ඇත්තේ මිනිසාට සහ තිරිසන් සතාට පමණි. දේව බ්‍රහ්ම යක්ෂ ප්‍රේත ආදීන්ට මොළයක් නැත. මන්ද යත් මොළය භෞතික වූවකි.

භෞතික වූ මොළය තිබිය යුත්තේ භෞතික කයක් සහිත සත්වයන්ට පමණි. භෞතික නොවූ කාම කයක් සහිත සත්වයන්ට මොළයක් තිබීම සිදු විය නොහැකි සෙයකි. සියලුම සත්වයන් පිළිබඳ සම සිතින් කටයුතුකළ බුදුරජාණන් වහන්සේ යම් හෙයකින් මොළය පිළිබඳ ඇගයීමෙන් යුක්ත වූයේ නම් එය මහත් අසාධාරණයක් වනු නියතය.

මොළය සහ සිත අතර සම්බන්ධය

පඥා, වියත්තා, විසාරදා ආදී නාමයන් මොළය හෙවත් බුද්ධිය ඇත්තාට පිටකාගත දේශනාවල දැක්වේ. මන, මනෝ, චිත්ත, චෛතසික, හද ආදී නාමයන් මනස හැඳින්වීමට ත්‍රිපිටකයෙහි දැක්වේ. ප්‍රඥාවන්තයා යනු මොළය ඇත්තා වන අතර ශ්‍රද්ධාවන්තයා යනු මනසක් ඇත්තා වශයෙන් සරලව විවරණය කළ හැකිය. බුද්ධ දේශනාව ප්‍රඥාවන්කයින් අරමුණු කරගෙන දේශිත වූවකි. කෙසේ වෙතත් ප්‍රඥාවන්තයා සහ ශ්‍රද්ධාවන්තයා වශයෙන් බුදු සමය මොළය හා මනස පදනම් කරගෙන පුද්ගල වර්ගීකරණයත් ඉදිරිපත් කර නොමැත. “ඉමෙ ධම්මා අකුසලා ඉමෙ ධම්මා කුසලා” කුසලාකුසල විභේදනය මස්තකප්‍රාප්ත කරන්නේ උක්ත මොළයෙහි සහ මනසෙහි අන්තර් ක්‍රියාකාරිත්වය පදනම් කරගෙනය.

භාවනාවෙන් මොළය සංවර්ධනය වන්නේ කෙසේද?

සිත සංවර්ධනය කිරීම භාවනාව වේ. එසේම කුසල ධර්මයන් වර්ධනය කිරීම, ඇසුරු කිරීම ද භාවනාවට අයත් කාර්යයන් වේ. (භාවෙතිකුසලෙ ධම්මේ ආසෙවති වඩ්ඪෙති එතායාතා භාවනා) මෙහිදී සිදු කරනුයේ සිහිය පිහිටුවීමයි. එහෙත් එය එක්වරම කළ හැකි දෙයක් වශයෙන් දක්වා නොමැත. පිළිවෙලින් සම්පූර්ණ කළ යුතු සීල, සමාධි, ප්‍රඥා නමින් ඉදිරිපත් කෙරෙන ත්‍රිවිධ ශික්ෂණ ක්‍රමවේදයක අභ්‍යාස කිරීම මේ සඳහා අභිප්‍රේතය. සීලය මූලික කරගෙන සමාධියත් ප්‍රඥාවත් වර්ධනය කළ යුතු ආකාරය අවධාරණය කොට ඇත. සීලය වශයෙන් දක්වා තිබෙනුයේ චතුපිරිසුද්ධි සීලයයි. එය සතරාකාරය.

1. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය
2. ඉන්ද්‍රිය සංවර ශීලය
3. ආජීව පාරිශුද්ධ ශීලය
4. ප්‍රත්‍යා සන්නිශ්‍රිත ශීලය

ශීල පාරිශුද්ධිය උදාකරගනිමින් සිත සමාධියට නැඹුරු කළ යුතු වේ. මේ සඳහා අදාළ චරිතානුකූල කර්මස්ථානයක් ලබා ගත යුතුය. සීල පාරිශුද්ධියෙන් යුක්ත යෝගාවචරයා කමටහනට සිත යොමු කරනවාත් සමගම පඤ්ච නීවරණයන් වික්ඛම්භන ප්‍රහානයෙන් දුරු වේ.

නීවරණයන් දුරුවීමත් සමග සතුට උපදී. සතුට උපන් ඔහුට ප්‍රීතිය උපදී. උපන් ප්‍රීතිය ඇත්තේ කාය ප්‍රශ්‍රබ්ධිය හෙවත් කය සන්සිඳීම ඇතිවේ. කයේ සන්සිඳීමත් සමග සැපය ඇති වේ. සැප ඇතිවීමට සිත සමාධිගත වේ. අනතුරුව ප්‍රථමධ්‍යානාදී සිව්වැදෑරුම් සමාධි අදියරයන් ඔස්සේ සමාධියෙහි පරිපූර්ණතාව උදාකර ගනී.

භාවනාවෙහි කූටප්‍රාප්තිය ප්‍රඥාවෙහි පරිපූර්ණතාවයි. සාමඤ්ඤඵල සූත්‍රයෙහි දැක්වෙන ක්‍රම පිළිවෙලට අනුව

1. විදර්ශනා ඥානය
2. මනෝම සිද්ධි ඥානය
3. ඉද්ධිවිධ ඥානය
4. දිබ්බසෝත ඥානය
5. චෙතොපරිය ඥානය
6. පුබ්බේනිවාසානුස්සති ඥානය
7. චුතූපපාත ඥානය
8. ආසවක්ඛය ඥානය

වශයෙන් පියවර 8 ක් ඔස්සේ ප්‍රඥා පරිපූර්ණතාව ගොඩනැගෙන අන්දම හඳුනාගත හැකිය. මෙබඳු වර්ධිත ප්‍රඥාවක් සහිත වූවෙක් අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යන සිව් පිළිසිඹියාවන්ගෙන් ද යුක්ත වන්නෙක් වේ. භාවනාව තුළින් පුද්ගලයා ලබන්නා වූ මානසික සංවර්ධනය මෙපමණකින් දුක්වුද එය මොළය සංවර්ධනය සඳහා කෙසේ බලපායිද, කුමන අන්දමේ වෙනසක් මොළය තුළ සිදු වේද යන්න සාකච්ඡා කිරීම වැදගත් වේ. නිරන්තරයෙන් එකම අරමුණක් වෙත සිහි පිහිටුවීම මගින් මනසිකාරයෙහි පරාසය වර්ධනය වේ. චින්තන පරාසය වර්ධනය වන විට මොළයේ නියුරෝන සෛල එකිනෙක අතර ඇති කරලන්නා සබඳතාවන්ගේ ප්‍රමාණයද අතිශයින් ඉහළ යයි. එසේ වන විට පුද්ගලයා මොළය පදනම් කොටගෙන සංවේදනය කරන්නා වූ සියලුම දෑ සාමාන්‍ය සංවේදන මට්ටම ඉක්මවූ පුළුල් පරාසයක සංජානන ක්‍රියාවලියක් ඔස්සේ හඳුනාගත හැකිවේ.

මෙහිදී වර්ධනය වන්නේ වින්දන තත්වයන්ගේ ස්වරූපයයි. ප්‍රථමධ්‍යානයේ දී විතර්ක, විචාර, පීති, සුඛ, ඒකාග්‍රතා යනුවෙන් අංග 5ක් පවතී. විතර්ක සහ විචාරයන්ට අයත් මොළයේ වම්පස අතිශයින් දියුණු මට්ටමකට පත් වේ. ප්‍රීත් යනු සිතෙහි ඇතිවන්නා වූ වින්දනාත්මක ස්වරූපයයි. සුඛ යනු කායික ඉන්ද්‍රිය බද්ධ සුවයයි. ඒකාග්‍රතා එකග බවයි. මේ සියල්ල හඳුනාගැනීමට තරම් මොළයේ සංවේදන කලාපයන් වර්ධනය වේ. ද්විතීයධ්‍යානයේ දී විතර්ක, විචාර දෙක නැති වේ. ප්‍රීතිය, සුඛය යන ඒකාග්‍රතාව පමණක් ඉතිරි වේ. එනම් මොළයේ ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා මට්ටමට වෙන් වූ සංවේදන කලාපයන් තවදුරටත් පුළුල් වේ.

තෘතියධ්‍යානයේ දී ප්‍රීතිය ද ඉවත් ව ගොස් සුඛ සහ ඒකාග්‍රතා මට්ටම් පමණක් ඉතිරි වේ. සුඛය යනු කාය ප්‍රශ්‍රබ්ධිය යි. එනම් කයෙහි සන්සිඳීමයි. මෙය මොළය ලදනම් කොටගත් ස්නායුක ක්‍රියාකාරිත්වයෙහි ප්‍රභල සංවර්ධනයක ප්‍රතිඵලයකි. මොළය මගින් කය වෙත පමුණුවනු ලබන සුවය කයෙහි ක්‍රියාත්මක වන සියලු පද්ධතීන් ක්‍රමානුකූල කරන්නට හේතු වේ. රුධිර සංසරණ පද්ධතිය, ආහාර ජීර්ණ පද්ධතිය, ස්නායු පද්ධතිය ආදී සියලු පද්ධතීන් කුමානුකූල වෙමින් කයෙහි සන්සිඳීම උපදවයි. චතුර්ථධ්‍යානයේ දී පිරිසිදු සිහියෙන් යුක්ත ඒකාග්‍රතාවය පමණක් ඉතිරි වේ. ඒකාග්‍රතාව පමණක් ඉතිරි වන විට විවිධ ඥාන ශක්තීන් ඉපදවීමට සිත නැඹුරු කළ හැකි වේ. ඒවා අභිඥාවන්ය. අභිඥා ලැබීම තුළින් ද සිදුවන්යේ විවිධ දැනීම් පරාශයන් හදුනාගත හැකි අන්දමට මොළයෙහි නියුරෝන සෛල අතර Synapses සබඳතා සුවිශාල වශයෙන් ඇතිවීමයි. එම දැනීම් පසුතලය කිසිසේත් ම සාමාන්‍ය පුද්ගලයෙකු තුළ ඇති නොවන චිත්ත සංවර්ධනය මගින්ම උපදවා ගත යුත්තකි. පුද්ගලයාට සිත සංවර්ධනය කිරීම හෙවත් භාවනා කිරීම තුළින් මොළයේ ක්‍රියාකාරිත්වය ප්‍රභල ලෙස වර්ධනය කළ හැකිවේ. 20 වන සියවසේ ලොව විසූ හොඳම දාර්ශනිකයා වූ ඇල්බට් අයිස්ටයින් මොළයෙන් ප්‍රයෝජන ගෙන තිබුණේ 11% ක් පමණක් බව ඔහුගේ මියයෑමෙන් පසු මොළය පරීක්ෂා සොයාගෙන තිබේ. යම් හෙයකින් භාවනාවෙන් චිත්ත සංවර්ධනයේ ඉහළම අදියරට යෑම හේතුවෙන් මොළය සංවර්ධනය වූවෙකුගේ ප්‍රතිශතය ගණනය කළහොත් එය 100% ක් වනු නොඅනුමානය. මේ අනුව භාවනාව යනු මොළය සංවර්ධනය සඳහා ප්‍රගුණ කළ යුතු නිවැරදිම පිළිවෙත බව සනාථ කළ හැකි වේ.

වෛද්‍ය ඉන්ද්‍රාණි රත්නාක මහත්මිය

පොසොන් පොහොයේ වැදගත්කම

ශ්‍රී බුද්ධ වර්ෂ 236 දී අනුබුදු මිහිඳු මා හිමියන් ශ්‍රී ලංකාවට වැඩම කිරීම.

ප්‍රථමයෙන් රජු ඇතුළු පිරිසට චුල්ල හත්ථි පදෝපම සූත්‍රය දේශනා කිරීම.

පසුව රට වැසියන්ට දේවදූත සූත්‍රය දේශනා කිරීම.

ලක්දිව වැසියන් මෙතෙක් පැවති දෙවියන් භූතයන් යක්ෂයින් ආදිව වන්දනා කිමේ අනිත්‍යතාව පෙන්වාදීම.

මහමෙව්නා උයන පූජා කිර්ම .

ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනය චිරස්ථායී වීමට අවශ්‍ය සෑම අංගයක්ම ඇතිකිරීම .

බෞද්ධාලෝක වෙසක් - ශ්‍රී.බු.ව. 2567

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය 22 වැනි වරටත් සංවිධානය කළ බෞද්ධාලෝක වෙසක් උත්සවය වෙසක් පුන් පොහෝ දින (05) සිට මැයි 08 දක්වා සම්මේලන මූලස්ථානය කේන්ද්‍ර කරගෙන පැවැත්විණි.

- සර්වඥ ධාතූන් වහන්සේලා වන්දනාමාන කිරීම.
- ශීල සමාදාන වැඩසටහන
- වෙසක් තොරණ
- වෙසක් පහන්කූඩු ප්‍රදර්ශනය
- බොදු උදාන ගී ගායනා
- චිත්‍ර ප්‍රදර්ශනය
- 24 පැය බත් දන්සැල

යන අංග බෞද්ධාලෝක වෙසක් උත්සවයට ඇතුළත් වූ අතර මැයි 08 දින රාත්‍රී 8.00ට නිදහස් චතුරස්‍රයේදී පැවැති බෞද්ධාලෝක බුද්ධාභිවන්දනා සංස්කෘතික ප්‍රසංගය සහ ත්‍යාග ප්‍රදානෝත්සවයෙන් පසු බෞද්ධාලෝක වෙසක් උත්සවය නිමාවට පත්විය.

බෞද්ධාලෝකය

බෞද්ධාලෝකය

බෞද්ධාලෝකය